


## බ්‍රිතාන්‍ය ජාතිකයෙකුගේ විමසුම් ඇසට ලක්වූ යටත් විජිත ලංකාව

*ලංකාවේ මහා පාවා දීම ලෙස සැලකෙන උඩරට ගිවිසුම මගින් උඩරට රාජධානිය බ්‍රිතාන්‍යයට ලියා පවරා දීම සිදුවී වසර 191 ක් ගත වී ඇති මේ මොහොතේ 19 වන සියවසේ ලංකාවේ පැවති සංස්කෘතික පසුබිම බ්‍රිතාන්‍ය ජාතිකයෙකුගේ ඇසට ලක්වී ඇති අයුරු විමසා බැලීමේ යම් වැදගත් කමක් ඇතැයි සිතමු. අප මේ කොටස් වශයෙන් ඔබ වෙත ගෙන එන්නේ 1892 දී ලියා පල කරන ලද ඇලන් වෝල්ටර්ස් ගේ පාම්ස් ඇන්ඩ් පර්ල්ස් නම් වූ කෘතිය ඇසුරෙන් සකස් කළ ලිපි පෙළකි.*

# තල්, පොල් සහ මුතු පබා

7 වැනි කොටස

ශ්‍රියා කුමාරසිංහ නවසීලන්තයේ සිට

**වර්ෂ 1881** දී ලංකාවේ වාසය රන්නවුන්ගේ සංඛ්‍යාව (යටත් විජිත ලේකම් කාර්යාලයේ ලේඛන වලට අනුව) 2,763,984ක් විය. මෙම සංඛ්‍යාවට, ලංකාවේ බටහිර දිග සැතපුම් 500ක් ඈතින් පිහිටි මාලේ කොදෙව් දූපත්වල වෙසෙන, සිංහල බසට නෑකම් කියන බස් වහරක් සහිත 30,000ක පමණ මිශ්‍ර ජන කොටස්ද එකතු විය යුතුය. එම මුළු ජනගහණයෙන් 1,846,614ක් වන නියම සිංහලයින් ප්‍රධාන වශයෙන් දූපතේ බටහිර සහ නිරිත දිග වෙසෙති. සමහර විට මොවුහු

කල, මෙම ඇස්තමේන්තුව පිළි ගැනීමට අපහසු එකක් බව පෙනී යයි. ලංකාවේ සිටි රණකාමීන්ට ඔවුන්ගේ ප්‍රතිභාව ලේඛන ගත කොට තැබීම සඳහා මැකෝලි හෝ ප්‍රෙස්කොට් වැන්නන් සිටියානම් මැරතන් සහ තර්මෝපිලිස් වැනි නම් සමග උරෙන් උර ගැටෙන ආකාරයේ නම් වලින් හැඳින්විය හැකි ස්ථාන මෙහි

## හෙළ බිමේ ජනී ජනයා

මුල් අවදියේදී ගංගා නම් ගං ඉවුරුබඩ සිට පැමිණ, වැද්දන් හා සටන් වැදුණු අයවලුන්ගෙන් පැවත එන්නන් විය හැකිය. වැද්දන්ගෙන් ඉතිරි වී ඇති සුළු ජන ප්‍රමාණයක් අදත් රට අභ්‍යන්තරයට වී එඬෙර සහ වනචාරී ජීවිත ගත කරති.

කාලයාගේ ඇවෑමෙන්, අප කලින් පරිච්ඡේදයේද සඳහන් කල පරිදි ඉන්දියාවේ මලබාර් වෙරළේ සිට පැමිණි ද්‍රවිඩයින් විසින් දිවයිනේ උතුරුකර දිස්ත්‍රික්කවල සිටි සිංහලයින් ඉන් ඉවතට පලවා හැරියහ. වර්තමානයේ සිටින ද්‍රවිඩයින්ගේ සංඛ්‍යාව 700,000 පමණ, එනම් මුළු ජනගහනයෙන් තුනෙන් එකකටත් වඩා අඩු ප්‍රමාණයකි. ශිව ඇදහිල්ලෙන් පමණක් නොව ඔවුන් ජාතියෙන් හා භාෂාවෙන්ද වෙනස්ය.

න්‍යායාත්මකව මෙන්ම ප්‍රායෝගිකවද, බෞද්ධයන් ලෙස සිංහලයින්ද, බ්‍රාහ්මණයින් ලෙස ද්‍රවිඩයින්ද සාමාන්‍ය කතෝලිකයින-"ට වඩා උසස් ය. නොඑසේ නම් අඩු තරමින් සමාන තත්වයක හෝ සිටී. බෞද්ධයින් පුනරුත්පත්තිය, නැතහොත් බව සංසරණය විශ්වාස කරති. එයට අනුව මනු"ෂ්‍යයෙකුගේ වර්'තමාන ජීවිතයේ ක්‍රියාකාරකම් මත මතු ජීවිතය රඳා පවතී. එමෙන්ම දැහැමි ජීවිත ගත කරන්නවුන්ගේ පිරිසිදු ආත්ම, නිර්වාණයට, එනම් ධ්‍යානගත වුවාක් බඳු වු තත්වයකට, නැතහොත් කිසි දෙයක් හා නොබැඳි පිරිසිදු අවලෝකනයකට පත් වෙති. බුදුන් වහන්සේ වහන්සේ විසින් දේශනා කරන ලද මූලික මූල ධර්ම තුන නම් පාප ක්‍රියාවන්ගෙන් වැලකීම, ධර්මය පිළි පැදීම, සහ සිත සංවර කර ගැනීමය.

සංඛ්‍යාත්මකව ගත් කල, සිංහලයන් වනාහී මිහි පිට වෙසෙන කුඩාම ජන වර්ග වලින් එකකි. ඉන්දු-ආර්ය ගණයට වැටෙන ඔවුන්ගේ භාෂාව පිරිසිදු ඉතාලි භාෂාවටද වඩා මෘදුය, සංගීතවත්ය. එහෙයින් වෙන කිසිම භාෂාවකට වඩා ශබ්ද රසයෙන් අනූනය. මාර්කෝ පෝලෝ ද, සිව් වැනි සියවසේ සංචාරකයෙකු වු ලුඩෝවිකෝ බර්තොලමියු ද සිංහලයන් යුදකාමී නොවන, එමෙන්ම සටනේදී බියගුළු ජාතියක් බව පවසා ඇත. අප ඉදිරියේ ඇති සිංහලයන්ගේ ඉතිහාස පොත් පෙරලා බලන

කඳුකරයේ තිබේ. මෙහිදී අප විසින් අමතක නොකල යුතු කරුණක් ඇත. එනම්, යුරෝ-



නුවර පෙරහැර - බ්‍රිතාන්‍ය පාලන යුගය

ප්පයේ විවිධ ජාතීන් නිරන්තරයෙන්ම කොටස් වලට කැඩී කැඩී එකිනෙකට වෙනස් ජාතීන් ලෙස ගොඩ නැගෙන අතරේ ලංකාව එහි පෞරාණික අනන්‍යතාවය හැකිතාක් දුරට රැ ක ගෙන ඇති ආකාරයයි. එහි භාෂාව, ආගම, සහ පූජනීය ස්මාරක ඉහත කී කාරණයේ ජයග්‍රාහී සාධක වේ. එඬෙර ගෝත්‍රිකයින් හැරුණු විට මහ පොලොව මත වාසය කරන සියළුම බෞද්ධ ජාතීන් අන් කිසිදු ජාතියකටත් වඩා දිගු කාලයක් සිය පෞද්ගලිකත්වය රැ ක ගන්නේ කෙසේද යන්න තවම ප්‍රමාණවත් ලෙස පරීක්ෂණයට ලක් වී නොමැත.

*සිංහලයින්ගේ අත් සහ කකුල් කුඩා මෙන්ම මටසිලුටුය. බොහෝ පිරිමි සුළඟිල්ලේ නියපොත්ත ඉතා අඟුදානවත් ලෙස දිගට වවති. එම පුරුද්ද චීන සහ තහිටි මිනිසුන් අතරද ඇත. එසේ වැවීමෙන් ඔවුන් ඇඟවීමට අදහස් කරන්නේ වැඩපලෙහි යෙදීමෙන් සිය අත් කිළිටි කර ගැනීමට ඔවුන් තුල පවත්නා නොකැමැත්තයි.* ***සිංහලයෝ වැඩෙහි යෙදීම මග හැරිය හැකි සෑම අවස්ථාවකම එසේ මග හැර වැඩ නොකර සිටිති.***

ද්‍රවිඩයන්, බ්‍රාහ්මණයින් ලෙස බ්‍රහ්ම වන්දනාවේ යෙදෙන්නේ හෝ ඔහු වෙනුවෙන් ආශ්‍රම ඉදි කරන්නේ හෝ නැති නමුදු, බ්‍රහ්ම යනු ස්වයංභූඥාණයක් ලෙස සලකා ඔහු කෙරෙහි විශ්වාසය තබා ඇත. බොහෝ කාරණා වලට අනුව බ්‍රහ්මගේ ඉතිහාසය ඒබ්‍රහම්ගේ තවත් අර්ථ කථනයක් සේ සැලකිය හැකිය. නම් දෙකේ කිට්ටු සමානත්වයක් ඇත. ඔහුගේ බිරිඳ සරස්වති සහ සාරා යන නම් දෙකද එබඳුය. මීළඟට මුවර් ජාතිය පිළිබඳව සලකා බලමු. සංඛ්‍යාවෙන් 184,000 පමණ වන ඔවුහු සියවස් විස්සකට පමණ පෙර ලංකාවට පැමිණි මහම-

දිකයින්ගෙන් පැවත එන්නෝ වෙති. අවුරුදු 1500ක් පමණ රටේ වෙළඳාම පැවතුනේ ඔවුන් අතෙහිය. වර්තමානයෙහි ද කොළඹ සිටින ඉතා සියුම්, ශූර බුද්ධියෙන් යුතු වෙළෙඳුන් අතර තවම මුවර් ජාතිකයින් දැකිය හැකිය.

රටේ ජනගහණය අතර තනිකර එක් ජාතියකට අයත් නොවන ආසියාතික සහ අප්‍රිකානු සංක්‍රමණිකයන්, මැලේ, ජාවා, පාසි, ඇප්ගන්, නීග්‍රෝ, කපිරි ආදීහු විශාල පිරිසක් සිටිති. අවසාන වශයෙන් 5000ක් පමණ වන යුරෝපියයන්ද, 18,000ක් පමණ වන යුරෝ-ආසියාතික බර්ගර්වරුන්ද, කලවම් පෘතුගීසීන් හා ලන්දේසීන්ද යන සියල්ලම එකතුව ගත් කල මුළු ජනගහණය 3,000,000ක් පමණ වනු ඇත. සිංහලයන් හීන්දෑරි ශරීරවලින් යුතුය. බොහොමයක් පිරිමි සෑහෙන දුරට නාරිමය සංකලනයකින් යුතුය. ඔවුන්ගේ සම කුරුඳු පැහැයට හුරුය. කළු හෝ දුඹුරු ඇස් සහිත මුහුණු ආසියාතිකයින්ට වඩා යුරෝපියයන්ට සමාන වේ. ඉතාමත් දැකුම්කළු කෙස් වැටි ඔවුන්ට තිබේ. ඔවුහු කොණ්ඩය හිස පසුපසට එකතු කොට වළල්ලක් මෙන් කරකවා ගැටයක් බඳිති.

එසේ ගැට ගැසූ කොණ්ඩය සෑහෙන පමණ ලොකු ඉබිකටු පනාවකින් සරසති. සමහරු යටගවුම් අඳිති. සමහරු යාර තුනක් දිග කම්බායක් ඉන වටේ පටලවා අඳිති. නුවර දිස්ත්‍රික්කයේ ඉහල පැලැන්තියේ අය පුද්ගලයෙකුගේ ගාම්භීර තරබාරු පෙනුම ඉතා වැදගත් කොට සලකන හෙයින් ඔවුහු සිය ශරීරය වටා සුදු කපු රෙදි රවුම් කීපයක් ඔතා ගනිති. සිංහලයින්ගේ අත් සහ කකුල් කුඩා මෙන්ම මටසිලුටුය. බොහෝ පිරිමි සුළඟිල්ලේ නියපොත්ත ඉතා අඟුදානවත් ලෙස දිගට වවති. එම පුරුද්ද චීන සහ තහිටි මිනිසුන් අතරද ඇත. එසේ වැවීමෙන් ඔවුන් ඇඟවීමට අදහස් කරන්නේ වැඩපලෙහි යෙදීමෙන් සිය අත් කිළිටි කර ගැනීමට ඔවුන් තුල පවත්නා නොකැමැත්තයි. සිංහලයෝ වැඩෙහි යෙදීම මග හැරිය හැකි සෑම අවස්ථාවකම එසේ මග හැර වැඩ නොකර සිටිති.

කඳුකර දිස්ත්‍රික්කවල ප්‍රධාන වශයෙන් ද්‍රවිඩයෝ කුලී කරුවන් ලෙස සේවය කරති. වැඩ කරන විට ඔවුන් අමුඩය යනුවෙන් හඳුන්වන කුඩා හතරැ ස් රෙදි කැබැල්ලක් පමණක් අඳිති. පැළඳ සිටින තලප්පාව සහ කඩුක්කන්, එමෙන්ම පෞරු"ෂයකින් යුතු හැඩිදැඩි පෙනුම සහ කැපී පෙනෙන තද කෝපි පැහැය හේතු කොට ගෙන නගරයේදී ඔවුන් සැනෙකින් වෙන් කොට හඳුනා ගත හැකිය. ඔවුන්ගේ එම පෙනුම වැරදි සහගත නොවේ. මන්ද යත්, ඔවුන් සන්සුන්ය, ක්‍රියාශීලීය, සිංහලයින්ට වඩා

32 පිටට

## කවි කොළය

මානව අයිතියට කෙණෙහිලි කරන හැටි
පැමිණිලි කරන්නට කොමිසම ළඟට ගිහින්
හයියෙන් අඬ අඬා විස්තර කරන ගමන්
මේකයි තමිල් වෙල්වම් කී අවනඩුව

ලොක්කගෙ උපන් දින සාදය හරි ඉහළින්
සමරන්නටම මේ ඔක්තෝබර් මාසේ
නැවකට බැලුම් පුරවා අරගෙන එද්දී
යුද හමුදාව කළ දේ නම් හොඳම නැත

වෙත්තසිංහ